# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2016 අගෝස්තු

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා වාර්ෂික උද්ධමනය 2016 අගෝස්තු මාසයේ 4.5% ක් දක්වා අඩුවී ඇති බවත් එය 2016 ජූලි මාසයේ දී 5.8% වූ බව ප්‍රකාශ කලේය. 2016 අගෝස්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.84% ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.61% ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 අගෝස්තු මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 113.3 ලෙස ප්‍රකාශයට පත් කර ඇත. අගෝස්තු මාසයේ දර්ශකය ජූලි මාසයේ දර්ශකය (115.2) හා සංසන්දනය කල විට 1.9ක දර්ශකාංක අඩුවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.6ක අඩුවීමක් වාර්තා වේ. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.8% කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.1% කින් වැඩිවීම බලපා ඇත.

2016 ජූලි මාසය හා සසඳන කල 2016 අගෝස්තු මාසය සඳහා ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.8%ක අඩුවීමක් දක්නට ඇත. මෙම අඩුවීම සඳහා එළවළු, අමු මිරිස්, සීනි, පොල්, වියළි හාල්මැස්සන්, සහල්, මයිසූර් පරිප්පු, රතුළූණු, අර්තාපල්, දෙහි, ලොකුළූණු සහ පාන් පිටි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් කෙසෙල්, බිත්තර, පැපොල්, අළුත් මාළු, අඹ සහ කුකුල් මස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

2016 ජූලි මාසය හා සසඳන කල 2016 අගෝස්තු මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.1%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'විවිධ භාණ්ඩ හා සේවා', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'රෙදිපිළි හා පාවහන්' සහ 'ආපනශාලා හා හෝටල්' යන කාණ්ඩවල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. ප්‍රවාහන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 2016 අගෝස්තු පළමු වෙනිදා සිට ක්‍රියාත්මක වූ බස් ගාස්තු වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත්, 'සන්නිවේදන', 'සෞඛ්‍ය', සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' කාණ්ඩවල වියදම්වල වටිනාකම පසුගිය මාසය හා සැසඳීමේදී අඩුවී ඇත. මෑතකදී වැඩිකල වැට් බදු අනුපාතයන් ඉවත් කිරීම හේතුවෙන් 'සන්නිවේදන', 'සෞඛ්‍ය', සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', යන කාණ්ඩවල මිල අඩුවිය. එසේම පසුගිය මාසය හා සසඳන කල විනෝදාත්මක හා සංස්කෘතික' කාණ්ඩයේ වියදම්වල වටිනාකම ඉතා සුළු අඩු වීමක් වාර්තා විය. අධ්‍යාපන කාණ්ඩයේ වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි. '




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | මාසික දර්ශකාංක වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2015** | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 |
| | ඔක්තෝම්බර් | 109.2 | 0.7 | 3.0 |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 |
| **2016** | ජනවාරි | 112.0 | -1.1 | -0.7 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 |
| | ජූනි | 116.1 | 2.1 | 6.4 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංක: 011-2147001 / 011-2147020